# "Karunawai Karunawai"

## as pilgrims rock to Sri Pada

It's December, and the annual pilgrimage season to Sri Pada is on. Traditionally, it starts on the full moon day in December and ends on the Wesak full moon day in May.

The beautiful full moon, covering her delicate face with a silky cloth to keep her away from the biting cold and the thin mist, peeps now and then producing a flash of light as if to show the way for the weary and exhausted pilgrims shivering in the cold who are climbing the mountain to pay homage to the foot print of the Buddha placed on its summit.



Amidst the luxuriant green vegetation and carpet-like tea plantations at the foot of the mountain, Samanala Kanda, popularly known as Sri Pada and Adam's Peak, poses an elegant, picturesque landscape - a rare sight indeed to behold. The mountain covered with thin mist lies basking in the sun during the day and takes a good shower of moonlight in the night, especially on days immediately before and after the full moon. From a distance, the mountain could be seen as a casket draped in a white silky cloth.

Gleeful shouts of "karunawai", "karunawai" (compassion to you, compassion to you) coming from pilgrims as a way of greeting each other, ascending or descending the mountain, break the serenity and stillness of the region. The echo of the word "karunawai" is capable of softening even the heart of a hard criminal living far away.

Centuries ago, Samanala Kanda, 7359 feet in height, was once thought to be the highest mountain in the world. It became sacred to most of the religions because of the impression of the footprint found on its summit. The Buddhists consider it as that of the Buddha whilst the Hindus claim it as that of God Siva, the Arabs that of Adam and of St Thomas the Apostle by some Christians. The Mahawamsa, the Buddhist chronicle, however, says that, at the request of God Saman, the hereditary deity, the Buddha in his third visit to Sri Lanka left the impression of his foot on the summit before going to Dighavapi.

According to legend, King Valagambha, who was dethroned and lived in exile in the wilderness for 14 years, came to the summit of the mountain almost accidentally while chasing a deer in one of his hunting trips and was surprised to see the footprint. The gods had assured him that it was the footprint of the Buddha.

The Mahawamsa also records that King Vijayabahu donated the village of Gilimalaya with its rich paddy fields and other plantations to meet the needs of food and drinks, and other requisites necessary for the pilgrims to make the pilgrimage easy and comfortable.

Most of the pilgrims to Sri Pada start the trek around 2.00 am in the morning from




Dalhousie at the foot of the mountain to reach its top by 6.00 am to witness the all-conquering sunrise.

The sunrise, as seen from the summit of the mountain, is a strange phenomenon. The sun that is normally expected to rise gradually is seen to take a sudden leap over the horizon. This the moment when more dedicated Buddhists, who firmly believe that it is the way the sun pays homage to the sacred footprint, are thrown into a frenzy of deafening chants of "sadhu", "sadhu" in keeping with their traditional way of paying their respects and homage to the sacred footprint of the Buddha.

The beauty and charm of this heart-throbbing spectacle is further heightened by the appearance on the undulating tableland on the western side a perfect triangular shadow of the Samanala Kanda, which, on a clear day without mist, will appear to stand upright. As the sun rises higher, the shadow will move towards the base of the mountain and finally disappear.

# රට.... පිටරට... සහ කණපිට....

දම්මිකා පී. වීරගේ

ශ්‍රී ලංකා ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ රැකියාවන්හි නිරත වෙති. ඒ අතර විදේශයන්හි පුරවැසිභාවය ලැබූවන්ද සිටී. ඒ එක් එක් පුද්ගලයාගේ කැමැත්ත අනුවය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඒ සියල්ලන්ටම හිමිව ඇති නිසා ඒ පිළිබඳව වැරදි කෝණයකින් බැලිය යුතු නැත. කණගාටු විය යුතු කරුණ එය නොවේ. කෙටි කාලීනව හෝ දිගු කාලීනව විදේශයක වෙසෙන කල් හී තමන් අත් විඳින සුඛෝපභෝගී දිවිය මතින් උපන් දේශය අවතක්සේරු කිරීමය.



මව්බිමේ සිටි තාක් සියලුම කටයුතු තනියම ඉටුකරගත් කාන්තාවන්ට දෙවසරක් ගෙවා ගම රට ගිය කළ නිව-සේ කටයුතු කිරීම අසීරුය. විදුලි උපකරණ අත්‍යවශ්‍ය භාණ්ඩ වේ. (කාලය අනුවත්, කාර්ය බහුලත්වය ඔස්සේත් එය සාධාරණීයකරණය කළ හැකි නමුත් මේ කරුණ එය හා සැසඳිය නොහැක) එළවළු කහට හෝ දැලි කුණු බිඳක් තැවරෙනවාට අකමැතිය.

අඩි සියයක් වත් පයින් ඇවිද යන්නට අකමැත්තක් දක්වන්නේ වෙහෙසවීමට ඇති අකමැති නිසා පමණක් නොව එයින් යම් මදි කමක්ද වෙතැයි සිතන නිසාය. අතමිට මුදල් ගැවසෙන තෙක් එය ගැටළුවක් නොවෙතත්, ස්ථිරවම මව්බිමට පය තැබූ පසු කුමක් වේවිද?

බොහෝ කාන්තාවෝ ආහාර පාන වලටත් වඩා ඇඳුම් පැළඳුම් සහ අලේපන වර්ග සඳහා මුල් තැන ලබාදෙනු දැකිය හැක. හදිසියකට ගන්නට හැට්ට කටුවක් පැනඩෝල් පෙත්තක් අත් බෑගයෙ නොවන සමහර කාන්තාවන්ගේ අත්බෑගයේ තොල් ආලේපන නිය ආලේපන නම් වරදින්නේ නැත. සමහරු ඇඳුම් තෝරාගන්නේ තමන්ගේ සිරුරට නොගැලපෙන ඒවාය. නිවසේ ස්වාමිදුව පරිහරණය කරන ක්‍රීම් වර්ග මිළදී ගන්නා කාන්තාවක් වරෙක පැවසූයේ ස්වාමිදුව පරිහරණය කරන ඒවා නිසා තමාද ඒවා තෝරාගත් බවය. අනේක විධ වූ දුක් ගැහැට මැදින් උපයා ගන්නා සොච්චම නිරපරාදෙ දියකොට හරින්නට තරම් අදූරදර්ශී කාන්තාවන් කොතෙකුත් සිටිනවා ඇද්ද ස්වාමිදුවගේ කුටිය පිරිසිදු කරමින් සිටි කාන්තාවක් මේසය මත වූ සුවඳැති ආලේපන වර්ගයක් සිය මුහුනේ තවරාගෙන ඇත. පැය භාගය පමණ පසු දරාගත නොහැකි දැවිල්ලකින් පසු ඇය සමේ ආසාදිත තත්වයකට ලක් වී ප්‍රතිකාර වෙත යොමු කොට ඇත. ඊට හේතු වී ඇත්තේ සම පිරිසිදු කිරීම සඳහා වූ එම ආලේපනය විනාඩි දෙකක් වැනි කාලයක් තුල සෝදා ඉවත් කළ යුතු වූවක් බවය. නිසි දැනීමකින් තොරව ආලේපන භාවිතය නිසා පසු කාලීනව සමේ රෝග සහ නොයෙකුත් ආසාධන වලට ගොදුරුවීමේ ප්‍රවණතාවයක් ඇති වග අප අමතක කළ යුතු නැත.

මෙවැනි රටවල කතුන් මියෙන තුරාම රූපලාවන්‍යය මගින් තම තරුණ පෙනුම රැකගත්තද දුප්පත් රටක වෙසෙන අපට එසේ නිස්කාරනේ මුදල් වියදම් කළ හැකිද?

ආහාර වේලට වතුර වීදුරුවක් එකතුවීම අපහසුවක් හෝ මදිපුංචිකමක් ලෙස සලකන පිරිසක්ද අප අතර වෙති. පෙප්සි කෝලා නොවේ නම් ආහාර දිරවන්නේ නැත. කෘත්‍රිම ආහාර පාන භාවිතය ශීඝ්‍රයෙන් රෝගීන් බවට පත්කරන බවට වෛද්‍යවරුන් පවා පෙන්වා දුන්නද ඒ උපදෙස් පිළිපැදීමට මැලිවෙති.

මව් රටට පිය නැගූවද නොරට ගෙවූ කාලය තුල තමන් ගෙවූ ජීවිතය පිළිබඳව පුරසාරම් දොඩන්නෝද අපමණ වෙති. මහමගසේකර ශූරීන් විසින් රචිත "සඳ සහ නිව්යෝර්ක් නුවර" මෙන් කැනඩාවේ සිට සරත් වීරසේකර මහතා පුවත්පතකට යොමු කළ අපූරු කාව්‍ය නිර්මාණයක් වරෙක මා නෙත ගැටිණි. උපන් දේශයේ සුළං රැල්ලක් තරම් වත් නොරට ලබන සැප සම්පත් වල අගයක් නොවන වග එහි සඳහන් වී තිබිණි.

නොහැකියාව මත විදේශයක කාලය ගෙවන්නට සිදුවුවද උපන් බිමේ අභිමානය අප සිත් තුල රැඳෙන තාක් ශ්‍රී ලංකාද්වීපය බැබලෙනු ඇත.